**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

**University of Sri Jayewardenepura**

**බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය**

**External Degrees and Extension Courses Unit**

---

## බාහිර උපාධි පාඨමාලා හදාරන සියලුම සිසුන් වෙත කෙරෙන

# විශේෂ නිවේදනයයි

බාහිර උපාධි අපේක්ෂකයින් වශයෙන් හෝ බාහිර උපාධිධාරීන් වශයෙන් පුද්ගලිකව හෝ සංවිධානාත්මකව **ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ නම සහ නිල ලාංඡනය භාවිතා කරමින් මතු සදහන් අවස්ථා ඇතුලු කිසිදු ආකාරයක බලය නොලත් කටයුත්තක් සිදු කිරීමට අවසර නොමැති බව** මෙයින් දන්වා සිටිනු ලැබේ.

තව ද මෙම දැනුම් දීමට පටහැනිව කටයුතු කරන පුද්ගලයන්ට හෝ සංවිධානවලට හෝ සමාජ මාධ්‍ය සමූහ පවත්වාගෙන යන්නන්ට එරෙහිව නීත්‍යානුකූල පියවර ගැනීමට සිදු වන බව අවධාරණය කරමි.

1. විශ්වවිද්‍යාලයේ නම සහ නිල ලාංඡනය භාවිතා කරමින් ශිෂ්‍ය සංගම්, ශිෂ්‍ය සංවිධාන හෝ සමාජ සමූහ පවත්වාගෙන යාම
2. විශ්වවිද්‍යාලයේ නම සහ නිල ලාංඡනය භාවිතා කරමින් විවිධ ව්‍යාපෘති, චාරිකා, උත්සව හෝ ප්‍රිය සම්භාෂණ ආදිය සදහා මුදල් පොත්පත් හෝ වෙනත් උපකරණ සහ ද්‍රව්‍ය එකතු කිරීම
3. විශ්වවිද්‍යාලයේ නම සහ නිල ලාංඡනය භාවිතා කරමින් ටී ෂර්ට්, බැනර් හෝ ස්ටිකර් වැනි නිෂ්පාදන සකස් කිරීම, ප්‍රදර්ශනය කිරීම, බෙදා හැරීම හෝ අලෙවි කිරීම
4. විශ්වවිද්‍යාලය තුළ හෝ පිටත විශ්වවිද්‍යාලයේ නම සහ නිල ලාංඡනය භාවිතා කරමින් උත්සව හෝ ක්‍රීඩා තරඟ පැවැත්වීම
5. විශ්වවිද්‍යාලයෙන් පරිබාහිර ආයතන හෝ සංවිධාන මගින් පවත්වනු ලබන තරඟ හෝ වෙනත් ක්‍රියාකාරකම් සදහා විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් සහභාගි වීම

නියෝජ්‍ය ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2024.01.11